සබරගමු අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Covide-19 සති පාසල් වැඩසටහන

නර්තන විෂය

12 දෙවන වාරය

කාලය-2020.05.04 සිට 2020.05.08

දිනය- 2020.05.08

නිපුණතාවය-06:නර්තන කලාව හා සබැදි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම

නිපුණතා මට්ටම-6.2:දේශීය නර්තන කලාවේ ආරම්භය හා විකාශනය පිළිබඳ ඓතිහාසික තොරතුරු යුග ඇසුරින් විමසුමට ලක් කරයි

පාඩම - අනුරාධපුර යුගය

කාර්‍ය පත්‍රිකා 1

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.

1.ක්‍රි.පූ.543 සිට ...........තෙක් වූ වසර 1560 ක කාලය අනුරාධපුර යුගය ලෙස හැදින්වේ.

(i)ක්‍රි.ව.1012 (ii)ක්‍රි.ව.1015

(iii)ක්‍රි.ව.1017 (iv)ක්‍රි.ව.1019

2. රුවන්වැලි මහාසෑයේ ධාතු නිධානෝත්සවයට දුටුගැමුණු රජතුමා නළඟනන්................පිරිවරාගෙන මහපෙරහරින් ගියවග මහාවංශයේ දැක්වේ.

(i)දහතුන් දහසක් (ii)දහසය දහසක්

(iii)දහඅට දහසක් (iv)දහනව දහසක්

3.ආතත,විතත,විතතාතත,ඝන,සුසිර යනුවෙන් ලංකාවේ පැවති සංගීත භාණ්ඩ ප්‍රථම වර්ගීකරණය දැක්වෙන්නේ,

(i)සමන්තපාසාදිකාවේ (ii)මහාවංශයේ

(iii)වංසත්තප්පකාසිනියේ (iv)විසුද්ධි මාර්ගයේ

4.දුටුගැමුණු රජු මහාසෑයේ ධාතු නිධානෝත්සවයේදී පූජා කළ වස්තු අතර........................ද වූ වග ඉතිහාසයේ කියවේ.

(i)නිළි රූපයක් (ii)වාමන රූපයක්

(iii)ඇත් රූපයක් (iv)දේව රූපයක්

5.සැස්සේරුව හා කොරවක්ගල සෙල්ලිපිවල සඳහන් වන්නේ,

(i)දුටුගැමුණු රජතුමා ධාතු නිධානෝත්සවයට පැමිණි ආකාරයයි

(ii) භික්ෂූන් වහන්සේලා ට ගල්ලෙන් පූජා කළ ආකාරයයි

(iii)නළුවන් හා නළුවන්ගේ දියණිවරුන් පිළිබඳවයි

(iv)දුටුගැමුණු රජු කලාවට දැක්වූ අනුග්‍රහය පිළිබඳවයි

6.අනුරාධපුර....................අසලින් නළඟනකගේ නර්තන විලාසයක් දක්වන ලෝකඩ රූපයක් සොයාගෙන ඇත.

(i)කුට්ටම් පොකුණ (ii)මහමෙව්නා උයන

(iii)ලෝවාමහාපාය (iv)අම්බස්තල දාගැබ

7.අනුරාධපුර යුගයට අයත් දැනට ඇති පැරණිම සෙල්ලිපි වනුයේ,

(i)සිතුල්පව්ව කොරවක්ගල සෙල්ලිපි (ii)කාලිංග උද්‍යානයේ සෙල්ලිපි

(iii)පාලමෙට්ටායි සෙල්ලිපි (iv)පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපි

8.වීණා වාදකයින්,තාලම්පට,හක්ගෙඩිය,නළා,හොරණෑ,එකැස්බෙර,උඩැක්කි වාදකයන්ගේ රූකම් දක්නට ලැබෙන්නේ

(i)ලෝවාමහාපායේ කණු හිස්වල (ii)මිහින්තලයේ කණු හිස්වල

(iii)මහාසෑයේ ගල් කණුවල (iv)අම්බස්තලයේ ගල් කණුවල

9.ක්‍රි.පූ.3 වන සියවසේ ථූපාරාමයේ නිදන් කිරීම සඳහා ධාතූන් වහන්සේලා ඇතෙකු පිට වැඩම කරවූ බවත්,අනේක තාලාවචරයන් විසින් එම ඇතා පිරිවරන ලද බවත් දැක්වෙන්නේ,

(i)මහාවංශයේ (ii)සමන්ත පාසාදිකාවේ

(iii)වංසත්තප්පකාසිනියේ (iv)විසුද්ධි මාර්ගයේ

10. .......................රජු සමයේ වසරක් පාසා අඛණ්ඩව බෝධි ස්නාන පූජා,මහා චෛත්‍යයේ විවිධාකාර වූ නෘත්‍යාකාරයන් විසින් කරන ලද නැටුම් හා නානාප්‍රකාර පසඟතුරුගොස පූජා පැවැත්වූ වග මහාවංශයේ දැක්වේ.

(i)දුටුගැමුණු (ii)දෙවන පැතිස්

(iii)භාතිකාභය (iv)අභය